## කුට්ටම් පොකුණ







# ඔහු කේමදාස නම් විය.

ලෝකයේ වරින් වර ශ්‍රේෂ්ඨ පුද්ගලයන් බිහිවේ. මේ පුද්ගලයන්ගෙන් සමහරක් ලෝක පූජිතවෙති. තවත් සමහරක් අප්‍රකට වෙති. උප්පත්තිය ලබන රට අනුවද, එම රටේ දුප්පත් පොහොසත්කම අනුවද මෙම සුපතලකම වෙනස්වන අතර, ප්‍රඥා මහිමය උරුමකරගත් මෙම ශ්‍රේෂ්ඨයන් සුපතල වූවා හෝ නොවූවා හෝ තම ප්‍රඥාවෙන් බිහිකරන සියලුම දෑ හිත සිතින් මානව වර්ගයාගේ සිත සුව පිණිස ලොවට දායාද කරති. මුළු ලොවටම සුපතල නොවූවත්, අපේම කියා මංසළකුණක් ලෝකය වෙත ගෙනයන්නට වෙර දූරූ මහා සංගීත ප්‍රඥයා වන්නේ ප්‍රේමසිරි කේමදාස නම් කලාකරුවායි.

කේමදාස නම් වන ඔහු ගැන ශ්‍රව්‍ය මෙන්ම දෘෂ්‍ය මාධ්‍යයවල හා මේ දෙකේම බොහෝ ගුණාංග පළවිණි. ඔහු ගැන වචනයක් කතා නොකළ උසස් අචාර්ය මහාචාර්යවරු පවා මියගිය පසු ගුණ ගායනා කර වචනයක් කීමට හා ලිවීමට අමතක නොකළහ. එසේම එකම වචනයක්වත් කථා නොකර මුනිවත රැක සිටි විද්වතුන්ද සිටියහ. එහෙත් මිය ගිය කේමදාසට වඩා මිය නොගිය කේමදාස ගැන අපි බොහෝ දේවල් ලියා ඇත්තෙමි.

කුට්ටම් පොකුණින් කේමදාසගේ වෙන්වීම ලිවීමට ප්‍රමාදවන්නේ සන්නස මාස් පතා පළවන පුවත්පතක් නිසාය. ඒ පිළිබඳව සන්නස පාඨකයන්ගෙන් මුලින්ම සමාව අයදිමු.

කේමදාම නිර්මාණ ශිල්පියා ගැන මුලින්ම කථා කළහොත් අපගේ ජීවිතය තුළ ඔහු පිළිබඳ නොමියෙන මං සළකුණවන්නේ සිනමා සංගීතයයි. බඹරු ඇවිත්, හිඟන කොල්ලා, ළසඳා, පාරදිගේ, වසන්තයේ දවසක්, අහස්ගව්ව, හන්තානේ කථාව, සොල්දාදු උන්නැහැ, වාසනා, තුනවෙනි යාමය, හංස විලක්, නිධානය ආදී චිත්‍රපට ගොන්න දෙස නෙත් යොමු කරද්දී අපට කේමදාස නම් පරිපූර්ණ සංගීත වේදීයාගේ පසුබිම් සංගීතයද නිතැතින්ම සිහියට පැමිණේ. ඒ බොහෝවිට තම සංගීත නිර්මාණ තුළින් අමරණීය සිහිවටනයක් ප්‍රේක්ෂකයාට ලබාදී ඇති නිසාය. එම නිර්මාණ අතීත පරපුරේ සිට වර්තමාන අනාගතත පරපුර දක්වාද තවමත් නොවෙනස්ව රසවිඳියි. නිධානය, බඹරු ඇවිත්, එයා දූන් ලොකු ළමයෙක් වැනි නිර්මාණ තුළ ඔහු තැබූ සළකුණ ජාත්‍යන්තරය දක්වාද ප්‍රසාරණය වූයේ ඒ නිසාය.

විදේශයන්හිදී එම පසුබිම් සංගීතය විශේෂ ඇගයීම්වලට ලක්විණි. සම්භාව්‍ය මෙන්ම වාණිජ චිත්‍රපටවලට ද තම සංගීතය තුළින් උපරිම සාධාරනත්වයක් ඉෂ්ට කළ මහා සංගීත ප්‍රඥයා වන්නේ ද ප්‍රේමසිරි කේමදාසයි. එසේම ප්‍රබුද්ධ පීචං යයි සම්මත ලංකාවේ කලාකුල භේදය තුළ, පීචං කලාව ප්‍රබුද්ධ කලාව වෙත තල්ලු කර යෑමට වෙහෙසක් දූරූ කලාකරුවන් අතලොස්සක් අතරින් සිටි එක් කලාකරුවෙක් වන්නේද කේමදාසය. ඔහු වාණිජ සිනමාව තුලට ජෝතිපාලගේ හඬ තුලින් අපූර්වතම සිනමා චාරිකාවක් ගෙත්තම් කළේය. එකල අමු අමුවේම හින්දි තනු කොපි කර තැනූ සිනමා සංගීත කලාව අපේම වාණිජ සංගීත කලාවට යොමු කළ කලාකරුවන් වන්නේද කේමදාසයි. ඔහු කිසිදිනක කිසි නිර්මාණයකට තම සංගීත රටාව තුලින් අසාධාරණයක් කළේ නැත. එකළ වසන්තයේ දවසක්, දූලීකා, වාසනා වැනි වාණිජත්වයට බර වූ කලාත්මක නිර්මාණ නැරඹීමට ප්‍රෙක්ෂකයන්ගෙන් සිනමාශාලා පිරී ඉතිරී ගියේ ඔහුගේ අපූරුතම ගී රස නිසාය. "සඳපෙම් යහනින් පායාවි", "දේදුන්නෙන් එන සමනලුනේ", ගිජිත ගුජං තක ගුජතත්", ඔබ ලඟ ඉන්න ලඟ ඉන්න මට වාසනා, ගෙදර හිටිය රෝස කැකුල, ආදර මල් පවනේ, සීත රෑ යාමේ. අඳුරේ වැනි රසාන්විත ගීතද බඹරු ඇවිත්, හංස විලක්, පූජා වැනි සම්භාව්‍ය යැයි සම්මත චිත්‍රපට සඳහා නිර්මාණය කළ, ආදරයේ ඔබ ඔබමැයි, හෙමින් සැරේ පියා සලා, දවසක් දා, අඳුනාගත්තොත් ඔබ මා, අම්මාවරුනේ වැනි ප්‍රතිභාව පිරි ගී තුළින්ද සිනමාව හා ප්‍රේක්ෂක රසිකයා හරහා අමානන්දනීය පාලමක් තැනුවේය. එසේම එකල නිර්මාණය වූ සුගතපාල සෙනරත් යාපාගේ හන්තානේ කතාව චිත්‍රපටිය හරහා නිර්මාණය කළ ගී තුළින් ඔහු තරුණ සිතුම් පැතුම් ඇදබැඳ තබාගැනීමට ගත් වෙහෙස ප්‍රශංසනීයය. එදා සනත් නන්දසිරි ගායනා කළ ඉරා අඳුරැපට පෙරදිග අහසේ ගිය සාමාන්‍ය පංතියේ සිට විශ්වවිද්‍යාල සිසු පරපුර දක්වාද බෙහෙවින්ම ජනප්‍රිය වූ ගීතයක් විය.

**වාමාංශික නැඹුරුවක් තිබූ වාමාංෂික දේශපාලනයක් කල කේමදාසයන් දේශපාලන පළිගැ-නීම්වලටද ලක්විය. එහෙත් එම පළිග ැනීම් තුලින් ඔහු සැලුනේද, කිසිවෙකුට හිස නැමුවේද නැත. කොන්ද කෙලින් තබාගෙන තම නිර්මාණ චාරිකාවේ යෙදුනේය.**

එසේම හැත්තෑව දශකයේ සමගි පෙරමුණ ආණ්ඩුව විසින් දියත් කල වගා සංග්‍රාමය පණගැන්වීමට ගුවන්විදුලියේ කාර්ය භාරය ඉටුකිරිමට ප්‍රාණ වායුව පිම්බේ ප්‍රේමසිරි කේමදාසයි. එකල හිමිදිරියේ විකාශනය වන ප්‍රබුද්ධ ගී වැඩසටහන තුලින් ඔහු බොහෝ නවක හා ආධුනික ගේය පද රචකයන්ට ද, ගීත ගායනා කළ ගායක ගායිකාවන්ටද බොහෝ අතහිත දුන්නේය. එදා එම ප්‍රබුද්ධ ගී තුලින් මැත්වී ආ බොහෝ කලා කරුවන් අද ඉහල පෙලේ ප්‍රතිභාපූර්ණ ගායක ගායිකාවන් බවට පත්වී ඇත. එසේම කේමදාසගේ සංගීතය තුලින් ඔවුන් එදා හඬදුන් ගී අදටත් ජනප්‍රියය. ටී. එම්. ගයන අඳුරු කුටිය තුළ, ඩී. ඩී. ගුණසේන ගයන සොඳුර මට සමුදෙන්න, ජෝතිපාල ගැයූ මම යනවා මම යනවා ජාතික රණබිම වෙත යනවා, නෙරංජලා ගයන සුදුවැලි මතුපිට, සනත් නන්දසිරි ගයන ගමේ කෝපි කඬේ, ටී. එම්. නීලා ගයන හෙට උපදින පුංචි පුතේ, ටී. එම්. ගයන පාවී පාවී මේ එන්නේ වැනි ගීත අදටත් වලංගු මෙන්ම ජනප්‍රිය තලයේ පවතිනේ කේමදාසගේ මියුරු සංගීතය නිසාය. එසේම සුදු වැලි මතුපිට දියබිඳු ඉස ඉස, හෙට උපදින පුංචි පුතේ, පාවී පාවී මේ එන්නේ, මම යනවා මම යනවා ජාතික රණබිම වෙත යනවා වැනි ගීතවල ගේය පදරචකයා වන්නේ මෛත්‍රී පනාගොඩ නම් සොඳුරු ගේය පද රචකයායි. ඔහු තවමත් නිර්මාණකරණයේ යෙදෙමින් සිඩ්නි නුවර අපත් සමඟ ජීවත්වෙයි.

ටෙලිනාට්‍යය සංගීතය තුලින් කේමදාසට විශාල මෙහෙවරක් කිරීමට නොහැකිවූයේ ඔහු අසනීප වීමත්, වයස්ගත වීමත් නිසාය. වකුගඩු රෝගයකින් පෙළුණු කේමදාස ඒ කාලය තුල වරින් වර අසනීප විය. ස්වාමීන් වහන්සේ නමක් පූජාකල වකුගඩුවක් බද්ධ කර ඔහු ටික කලක් ජීවත් වුවත්, එයද කාලයාගේ ඇවෑමෙන් අක්‍රීය විය. එහෙත් එම ටික කාලය තුල ඔහු ටෙලිනාට්‍යය කිහිපයකට සම්බන්ධ වෙමින් අපූරු දස්කම් පෙන්වීය. දඩුබස්නාමානය, කඩුල්ල වැනි නිර්මාණ තුලින් අධ්‍යක්ෂවරයා ද ඉස්මතු කර, ඔහුගේ සංගීතය කළ පෙළහර අපූරුය. එසේම මානස විල, අග්නි බැරි සිල්, පිරිනිවෙන් මංගල්‍යය වැනි ඔපෙරාවන් තුලින් සංගීතය යනු මිනිස් ජීවිතය හා බද්ධව සකලවිධ යථාර්තයන් එළිපෙහෙළි කරගන්නා ශාන්ති කර්මයක්ය යන්න ඔහු ජනතාවට ඔප්පුකර පෙන්වූයේය. එසේම බොහෝ වේදිකා නාට්‍යවලද ඔහු දායාද කළ සංගීත රසය මනරම්විය. එකළ රන්ජිත් ධර්මකීර්තිගේ අන්ගාරා ගඟ ගලා බසී. වේදිකා නාට්‍යයේ සංගීතයට මම බෙහෙවින් වශීවී සිටියෙමි. ඔහුගේ සංගීතය නිසාම මම එම නාට්‍යය කිහිපවරක් නැරඹුවෙමි.

වාමාංශික නැඹුරුවක් තිබූ වාමාංෂික දේශපාලනයක් කල කේමදාසයන් දේශපාලන පළිග ැනීම්වලටද ලක්විය. එහෙත් එම පළිගැනීම් තුලින් ඔහු සැලුනේද, කිසිවෙකුට හිස නැමුවේද නැත. කොන්ද කෙලින් තබාගෙන තම නිර්මාණ චාරිකාවේ යෙදුනේය.

එකළ ජනාධිපති සම්මාන උළෙලකදී කේමදාසගේ නම නිර්දේශ වී තිබියදීත්, සම්මානය පුදකලේ ආරාධනා චිත්‍රපටිය වෙනුවෙන් රෝහණ වීරසිංහ හා එච්. එම්. ජයවර්ධන යන සංගීතඥයන් දෙදෙනාටය. මන්ද එම චිත්‍රපටියේ සංගීතය වෙනුවෙන් දෙදෙනාම සහභාගි වූ තිබූ නිසාය. එහෙත් දෙදෙනාම එම සම්මානය කාරුණික ප්‍රතික්ෂේප කර එයට සුදුසුම පුද්ගලයා වන්නේ කේමදාස නම් මහා කලාකරුවා බව මාධ්‍යවලට ප්‍රකාශ කලේ ගෞරවනීයව ය.

එසේම සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනියට කේමදාසව පාර්ලිමේන්තුවට ගැනීමට එදා තදබල උවමනාවක් තිබුණාය. එහෙත් අද මෙන් එදා එය ලෙහෙසි පහසු කටයුත්තක් වූයේ නැත. එසේම කේමදාසට පැය 24ක් පාර්ලිමේන්තුවට එන උවමනාවක්ද තිබුණේ නැත. ඔහු එය පසු පස එලවා ගියේද නැත. "පාර්ලිමේන්තුවට යනවාට වඩා පාරලිමේන්තු ගැට්ටේ සිට සංගීතය තුලින් ජනතාවට සේවය කල හැකි බව" ඔහු ප්‍රකාශ කලේ හදපිරි සතුටිනි.

කේමදාස තුල තිබූ එක් දූර්වල ලක්ෂණයක් වූයේ ඉක්මනින් කේන්ති යාමයි. එම දූර්වලකම නිසා බොහෝ ජේෂ්ඨ කලාකරුවන් පිරිසක් ඔහු අතහැර ගියා පමණක් නොව ඔහුගේ සංගීතය හා එම කලාකරුවන්ගේ සංයෝග තුලින් අපට රසවිඳීමට තිබූ බොහෝ නිර්මාණ ගොන්නක්ද අපට අහිමි ගියහ. එහෙත් එම කේන්තිය නිර්මාණයට සාධාරණයක් ඉෂ්ට කරගැනීමක් විනා පෞද්ගලික තරහක් නොවන බව අද කේමදාසයන් ඔප්පුකර හමාරය. එසේම ජේෂ්ඨ කලාකරුවන් අතරින් ඔහු මැතක් වනතුරු ස්තූති පූර්වකව මතක් කල කලාකරුවා වන්නේ සනත් නන්දසිරියි. කුමන ප්‍රශ්න තිබුණත් කේමදාස නම් මහා කලාකරුවාගේ දූක අද්දර සනත් නන්දසිරි නිතර ගැවසුනේය.

අද කේමදාස නම් වන සොඳුරු සංගීතවේදියා අපහැරදා ගොස්ය. එහෙත් ඔහු කළ නිර්මාණ ඔහුගේ මතක රුව සමඟ අප අසල ජීවත් වෙයි. එසේම කේමදාසගේ සංගීත රස විඳින මට පන්සිය පනස් ජාතක කථාවල එන ඵල ජාතකය නිතැතින්ම සිහියට නැගෙයි. එයින් ලබාදෙන උතුම් පණිවුය වන්නේ යම්කිසි අනගි ශාස්ත්‍රයක මනා නිපුනත්වයක් ලබා එයින් අන් අයට ලබා දෙන ආශ්වාදය එලොවටත් මෙලොවටත් යහපතක් උදාකරන බවයි. කේමදාස ඔබට නිවන් සුව !

ලක්ෂමන් කොඩිතුවක්කු

GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial
- Conveyancing - Sale or Purchase of Houses, Vacant Land, Units, Flats, Shops, Factories & Farms
- General, Medical or Enduring Powers of Attorney
- Wills & Estate Planning

*Professional, Quality Service Assured*

Senanie Kurukularatne LL.B, Grad Dip.LP
Barrister & Solicitor
Attorney -at- Law - Sri Lanka

Phone : 03 87869682
Fax : 03 87869681
Mobile : 0414 660 513
Email : gateway5@bigpond.net.au
17, Glenview Rise, Berwick, VIC 3806 Austraila